දෙපාර්තමේනතු චක්‍රලේඛ අංක :- 03/ 2014,

මගේ අංක :- එස්.ටී.සී/පී.එස්/2014,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ - 09,
2014. 01. 09 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් වෙත.

**<u>2013 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කිරීම සම්බන්ධවයි.</u>**

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංකඃ එෆ්.අයි.එන්./1051/එෆ්/192/18/ඒ.බී/ඩී හා 1985.06.18 දිනැති චක්‍රලේඛයේ දෙවන (2) ඡේදයට ඔබගේ අවධානය යොමුකරවනු කැමැත්තෙමි.

02. එහි දෙවන ඡේදය අනුව 2013 වර්ෂයේ පාලන වාර්තාව 2014 මාර්තු මස 01 වන දිනට පෙර මා විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතුව ඇත.

03. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සෑම ආයතනයකින්ම වාර්තා ලබාගෙන සංඛ්‍යා දත්ත චක්‍රගත කොට වාර්තා සම්පිණ්ඩනය කර දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සකස් කල යුතු වේ.

04. ඔබ ආයතනයේ 2013 වර්ෂයේ සංඛ්‍යාලේඛන වාර්තාව 2014 පෙබරවාරි මස 15 වන දිනට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට සලස්වන ලෙස දන්වමි. දත්ත නිවැරදිවත්, පැහැදිලිවත් සහ සංසන්ධනාත්මකවත් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීම බව සැලකිය යුතුය.

05. සංඛ්‍යාලේඛන වාර්තාව සැකසීමේ දී අදාල ආකෘති පත්‍ර මේ සමඟ එවා ඇති අතර එහි පිටපතක් ඔබ කාර්යාලයෙහිද තබාගැනීමට වගබලා ගතයුතුය.

06. 2013 වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත සටහන් පොත් ලද බව දන්වන්න.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්